# අස්වීම හා අස් නොවීම

ඒකාබද්ධ යාන්ත්‍රණය හෝ සුනාමි සහන මණ්ඩලය හෝ වෙනත් නමකින් හෝ කොටි සංවිධානයට රටේ පාලන තන්ත්‍රයට සහභාගිවීමට අවස්ථාව සපයමින් පිහිටුවීමට යන ආයතනයට විරුද්ධව දසතින් ම විරුද්ධතා පැන නැගෙමින් පවතියි. දසතින් ම යන්නට උතුරු හා නැගෙනහිර පළාත් ද අයත්වන බව කිව යුතු ය. එහෙත් ජනාධිපතිනිය තමන්ගේ හා බටහිරයන්ගේ තීරණය නොවෙනස්ව ඉදිරියට ගෙනයෑමට බලාපොරොත්තුවෙයි. ඇය කියන්නේ ජීවිතය පරදුවට තබා කොටින්ට රටේ පාලන තන්ත්‍රයට සහභාගිවීමට අවස්ථාව සපයන බව ය.

මේ අතර ජ වි පෙරමුණ පවසන්නේ මේ ඊනියා සුනාමි සහන ණය (සුසණ) මණ්ඩලය පිහිටුවහොත් තමන් අස්වන බව ය. ෆේරියල් අශ්‍රොෆ් මැතිණියට ද ඉන්පසු තවදුරටත් ආණ්ඩුවේ ඇමතිනියක් ලෙස කටයුතුකිරීමට නොහැකිවනු ඇත. මුස්ලිම් ජනයා, විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනයා සුසණ මණ්ඩලය හෙවත් සුසාන මණ්ඩලයට විරුද්ධ වෙති. අෂ්‍රොෆ් මැතිණිය පාර්ලිමේන්තුවේ නියෝජනය කරන්නේ මේ ජනතාව ය. මහජන එක්සත් පෙරමුණට ද සුසාන මණ්ඩලයක් පිහිටුවීමෙන් පසුව තවදුරටත් ආණ්ඩුවේ රැඳී සිටීම ප්‍රශ්නයක් වනු ඇත.

ජනාධිපතිනිය කියන්නේ පක්ෂ තුනකින් හෝ ආණ්ඩුව කරගෙන යන බව ය. නැගී එන ජනතා විරුද්ධතාව මැද ඇය දඩබ්බර ලෙස බටහිරයන් හා දෙමළ ජාතිවාදය වෙනුවෙන් පෙනී සිටීමෙන් පෙනීයන්නේ අගේ දේශපාලන ජීවිතයේ අවසාන කාලයේ දී හෝ බටහිරයන් ඇගෙන් බලාපොරොත්තුවූ දේ ඉටුකිරීමට ඇය සූදානම් බව ය. අප පුන පුනා කියා ඇති පරිදි  බටහිරයන් එකල මහජන පක්ෂයේ ඇතැම් සාමාජිකයන් හා රාජ්‍ය නොවන සංවිධාන යම් ප්‍රමාණයක් මගින් ඇය ලංඩනයේ සිට ගෙන්වාගනු ලැබුයේ මෙරට සහසන්ධීය රාජ්‍යයක් පිහිටුවීම සඳහා ය.

ඇගේ මුල් පියවර වූයේ ඊනියා පැකේජය ය. ඇයට එහි දී සහාය දුන්නන් අතර දෙමළ ජාතිවාදීන් ඇතුළු ඉහත කී කණ්ඩායම් මෙන්ම ක්‍රිස්තියානි පූජකවරු ද පල්ලි නිකායේ භික්ෂූහු ද වූහ. ඉතා ප්‍රබල දේශීය හා විදේශීය කණ්ඩායම් ඇයට සහාය දුන්න ද ජාතිකත්වයේ බලවේග හමුවේ ඇයට ඒ සියල්ල හකුළාගැනීමට සිදුවිය. ජාතිකත්ව බලවේගයට ඇති ශක්තිය ඇය එදා තේරුම් ගන්නට ඇත.

රනිල් වික්‍රමසිංහ මහතා මිනීමරු ප්‍රභාකරන් සමග  ඊනියා අවබෝධතා ගිවිසුමක් ඉන්පසු කාලයක දී අත්සන් කෙළේ කුමාරතුංග මහත්මියට දීගත නොහැකි වූ දෙයක් කොටින්ට ලබාදීමට ය. නෝර්වේ රාජ්‍යයේ සෘජු මැදිහත්වීමෙන්, පාර්ලිමේන්තුවට හෝ ඉදිරිපත්නොකරන ලද නීත්‍යානුකූල නොවූ ඒ ගිවිසුමෙන් බලාපොරොත්තු වූයේ කොටින්ට ඊනියා නීත්‍යානුකූල පිළිගැනීමක් ලබාදීමටත්, කොටින්ගේ සන්නද්ධ ත්‍රස්තවාදී කණ්ඩයම්වලට හමුදාවක තත්ත්වය ලබාදීමත් ය. ඒ ගිවිසුම නිසා ඊනියා සාමයක් උදාවී ඇති බව පෙන්වීමට උත්සාහ ගන්නෝ ඒ ජා පාක්ෂිකයෝ පමණක් ම නො වෙති.

අද වන විට මුදල් ඇමති සරත් අමුණුගම මහතා වැන්නෝ ද ඒ පාවාදීමේ ගිවිසුම වෙනුවෙන් කතාකරති. මෙරට ආර්ථික වර්ධනයක් වී ඇත්තේ ඒ ගිවිසුම නිසා යැයි පෙන්වීමට අමුණුගම මහතා උත්සාහයක් දරා ඇත. විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයකු හා සමසමාජ කණ්ඩායමේ සාමාජිකයකු ලෙස පංති වර්ජන මෙහෙයවුව ද සිවිල් සේවකයකු වූ ඒ මහතා  අද නැවතත් සමසමාජ ස්ථාවරයට පැමිණ ඇත. ඒ දෙමළ ජාතිවාදය සම්බන්ධයෙන් ය. අද ඊනියා වම පවතින්නේ දෙමළ ජාතිවාදයට දෙන සහාය මත ය. දෙමළ ජාතිවාදයට සහාය දෙන සිංහලයන් ටික දෙනාගෙන් ඉතා විශාල පිරිස එක්කෝ පැරණි මාක්ස්වාදීහු/සමාජවාදීහු වෙති. නැත්නම් ක්‍රිස්තියානි/කතෝලික භක්තිකයෝ වෙති.

පසුගිය කාලයේ මෙරට ආර්ථික වර්ධනයක් ඇති වී තිබෙන්නේ මහා බැංකු වාර්තාවලට පින්සිදුවන්නට ය. මහාබැංකු වාර්තා ගැන අසා දැනගත යුත්තේ මහා බැංකු සේවකයන්ගෙන් ම පමණකි. ඒ කෙසේ වෙතත් ඒ ජා ප නායකයා හා කොටි සංවිධානයේ නායකයා අතර ඇති වූ ගිවිසුමෙන් ඊනියා සාමයක් උදාවී තිබේ ද? සාමය යනු කොළඹ බෝම්බ නොපිපිරවීම නම් එහි යම් සත්‍යතාවක් ඇත. එහෙත් බෝම්බ නොපිපිරවීමෙන් පමණක් උදාවන සාමයක් නැත. අද

© Prof. Nalin De Silva

ඇත්තේ සීතල සටනකි. කොටි සංවිධානය දිගින් දිගටම රජයේ ඔත්තුසේවා නිලධාරීන් ඝාතනයකරයි. කරුණා පාර්ශ්වය සමග නොනවතින සටනක් විශේෂයෙන් ම නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වෙයි.

පාවාදීමේ ගිවිසුමෙන් සිදුවී ඇත්තේ හමුදාව අක්‍රිය කිරීම ය. හමුදාව අක්‍රිය ව සිටිය දී කොටි සංවිධානය තමන්ට අවශ්‍ය හමුදා නිලධාරීන් අමු අමුවේ මරාදමයි. කොටි ගුවන් පථ ඉදිකරති. මේ සම්බන්ධයෙන් ඉන්දියාව කණස්සල්ල පළකර ඇත. එහෙත් ලංකාණ්ඩුව කිසිවක් කර නැත. මෙහි දී කිවයුත්තක් වෙයි. ඉන්දියාව මේ ප්‍රශ්නය දෙස බලන්නේ තමන්ගේ පැත්තෙන් බව අප හොඳින් තේරුම්ගත යුතු ය. ඔවුන් ඉදිරිපත්කරන විසඳුම් ද අවසාන වශයෙන් පදනම්වන්නේ ඔවුන්ගේ ඉතිහාසය හා අනාගතය මත ය. ඒ පිළිබඳ කිසිවකු හාන්කවිසියක හෝ සැකයක් තබා නොගත යුතු ය. සිංහලයන්ගේ පැත්තේ සිට ඉන්දියාවෙන් උපකාර බලාපොරොත්තුවන්නන් මේ කරුණ හොඳින් මතකතබාගත යුතු ය.

අද චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය උත්සාහ කරන්නේ කොටින්ට ඊළම දීමේ මීළඟ පියවර ගැනීමට ය. රනිල් වික්‍රමසිංහ මහතා මෙන් ම චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ද ඉංගිරිසින්ගෙන් සිංහලයන්ට ලැබුණු නායකයන් මිස සිංහල නායකයෝ නො වෙති. එබැවින් ඔවුන් දෙදෙනා ම එකම මගක ගමන්ගැනීම පුදුමයක් නො වෙයි. සුසාන මණ්ඩල ඔස්සේ කුමාරතුංග මහත්මිය සූදානම්වන්නේ කොටින්ට උතුරු හා නැගෙනහිර පළාත්වල පරිපාලන බලතල ලබාදීමට ය.

මේ බලතල අවුරුද්දකට පමණක් යැයි හා වෙරළෙන් සැතපුම් දෙකකට සීමාවන්නේ යැයි ඇය පවසයි. එහෙත් බලතල ලබාගැනීමෙන් පසු කොටි ක්‍රියාකරන ආකාරයට ඊනියා අවබෝධතා ගිවිසුම පමණක් වුව ද සාක්ෂි සපයයි. කොටින්ට අවශ්‍යවන්නෙ කෙසේ හෝ කකුලක් තබාගැනීමට ය. සුසාන මණ්ඩලය පිහිටුවුවහොත් එය කිසිම දිනක අවුරුද්දකින් අවසන් නොවනු ඇත. එය මේ රටේ සුසානය බවට පත්වනු ඇත. එමෙන් ම එය කිසි දිනෙකත් වෙරලෙන් සැතපුම් දෙකකට පමණක් සීමා නොවනු ඇත.

ආණ්ඩුවේ පරිපාලනය යනු සෙල්ලමක් හෝ ළමුන්ගේ වැඩක් හෝ නො වෙයි. ඒ වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම ආණ්ඩුවේ පරිපාලනයයි. එයට හිමි රටාවක් ඇත. ආණ්ඩුවේ පරිපාලනයට දේශපාලන පක්ෂ සම්බන්ධ නො වෙයි. මෑතක සිට ආණ්ඩු පක්ෂයේ හිතවතුන් හා හිතවතියන් ආණ්ඩුවේ පරිපාලනයට සම්බන්ධ කරගෙන තිබෙන බව රහසක් නො වෙයි. එහෙත් එය ද, සදාචාරයට පටහැණි වුවත්, ආණ්ඩු බලය ඇති පක්ෂයට හෝ පක්ෂවලට පමණක් සීමා වී ඇත. සුසාන මණ්ඩල පිහිටුවීමෙන් කොටි සංවිධානයට ද ආණ්ඩු බලය හිමි පක්ෂයක තත්ත්වයක් ලැබෙයි. කොටින්ට එයටත් වඩා බලයක් ලැබෙන්නේ කොටි සංවිධානය අදාළ ලියකියවිලිවලට අත්සන්කරන්නේ ආණ්ඩුව සමග මිස ආණ්ඩු පක්ෂය සමග නොවන බැවින් ය. කොටි සංවිධානය එක් පෑන්පහරකින් ආණ්ඩුවේ පරිපාලනයෙහි කොටස්කරුවකු බවට පත්වෙයි.

සුසාන මණ්ඩල හොර රහසේ පිහිටුවීමේ වැයමක් ද වෙයි. එය හුදු පරිපාලන ක්‍රියාවක් බව පෙන්වමින් එය සුළුකොට දැක්වීමේ ක්‍රියාවලියක් ද මේ වන විට ක්‍රියාත්මක වන බව පෙනෙයි. ඒ සඳහා දැනටමත් සාධක දෙකක් ඇත. එකක් පසුගිය දා ඊනියා සුනාමි මණ්ඩලයක් නමින් පුවත්පත්වල පළ වූ දැන්වීම් ය. ලිපිනයක් නොමැතිව රාජ්‍ය ලාංඡනය සහිත ව ඒ දැන්වීම් පළකර තිබුණේ ඒ ආයතන දැනටමත් පිහිටුවා ඇත යන හැඟීමක් දෙන අයුරින් ය. අනෙක් සාධකය අගමැති මහින්ද රාජපක්ෂ මහතා පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමියන් ප්‍රධාන නියෝජිත පිරිසකට හා මහනුවර උපවාසය පැවැත්වෙන තැනට ගොස්කළ ප්‍රකාශ ය. ඒ මහතාට අනුව ඊනියා සුනාමි මණ්ඩල පිහිටුවීම හුදු පරිපාලන කටයුත්තකි. එසේම එය දිවි පරදුවට තබා කළ යුත්තක් ද නො වෙයි. ඒ එතරමට ම සුළු දෙයකි. අනෙක් අතට එවැනි දෙයක් කළ යුත්තේ කෑ ගසා ප්‍රසිද්ධිය දීමෙන් ද නො වෙයි.

මේ නම් භයානක ප්‍රකාශයකි. හුදු පරිපාලන කටයුත්තක් ලෙස ඊනියා සුනාමි මණ්ඩල පිහිටුවීම මෙහි යටි අදහස වෙයි. ඒ ජනතාවගේ ඇස්වලට වැලිගැසීමකි. සන්ධානය බලයට පත්වූයේ රනිල් වික්‍රමසිංහ මහතාගේ පාවදීමේ ක්‍රියා පිළිවෙතට එරෙහිව මිස ඒ මගේ ගොස් කොටින්ට තව තවත් නීත්‍යානුකූල තත්ත්වයන් ලබාදීමට නො වෙයි. සන්ධානය පීලි පන්නා නැවතත් මහජන පක්ෂයේ ගමන්මගට ගෙන ඒමට උත්සාහ කරන උප ඇමතිවරු කිහිප

© Prof. Nalin De Silva

දෙනෙක් වෙති. ඔවුන්ගේ නායකත්වය දරන්නේ සිංහල බෞද්ධයකු යැයි කිව නොහැකි ඩිලාන් පෙරේරා මහතා ය. අද සන්ධානයෙන් හා ආණ්ඩුවෙන් අස්විය යුත්තේ සන්ධාන ප්‍රතිපත්තිවලට එරෙහිව යන ජනාධිපතිනිය, අගමැති, ඇමතිවරු හා උපඇමතිවරු ය. එහෙත් ඔවුහු අස් නොවෙති. ජ වි පෙරමුණට ආණ්ඩුවෙන් අස්වීමට සිදු වී ඇත්තේ මේ අස්විය යුතු එහෙත් අස්නොවන අය දේශපාලනයෙන් අස්කිරීම සඳහා ය.

© Prof. Nalin De Silva